සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | 01 | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

නම ........................................................... විභාග අංකය ...............................

සැලකිය යුතුයි .

(I) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(II) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (I) (II) (III) (IV) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරාගන්න.

(III) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක්එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (+) ලකුණ යොදන්න.

(I) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා ද පිළිපදින්න.

01. නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ
- (I) යසෝදරා දේවිය විසිනි
- (II) මහා ප්‍රජාපති ගෝතමිය විසිනි
- (III) කිසාගෝතමිය විසිනි
- (IV) විශාඛාව විසිනි

02. බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් ගැබිනි මාතාවන්ට සෙත්පතා දේශනා කරන ලද්දේ.
- (I) වට්ටක පිරිත
- (II) අංගුලිමාල පිරිත
- (III) ජය පිරිත
- (IV) කඳ පිරිත

03. තෙරුවන් ගුණ සංඛ්‍යාව වන්නේ
(I) 06කි (II) 24කි (III) 09කි (IV) 12කි

04. සිදුහත් කුමරු තරුණ ජීවිතයේ අභියෝග ඉතා සාර්ථකව ජයගත් අවස්ථාවක් වන්නේ.
- (I) පංචමහා විලෝකනය
- (II) උපන් විගස පියවර තැබීම
- (III) සක්විති රජකම ලබා ගැනීම
- (IV) සියළු ශිල්ප මැනවින් හැදෑරීම

05.සියළු පුජාවන්ට සුදුසු වු හෙයින් බුදුරජාණන් වහන්සේ.
- (I) අරහං නම් වන සේක.
- (II) සුගතෝ නම් වන සේක
- (III) ලෝකවිදූ නම් වන සේක
- (IV) සම්මා සම්බුද්ධ නම් වන සේක.

papers.lk

06 ගිහි සමාජය භික්ෂූන් වහන්සේලාට උපකාර කළයුතු වන්නේ

(I) මිල මුදල් දීමෙන් (II) දන්දීමෙනි

(III) වෙහෙර විහාර ඉදිකර දීමෙනි (IV) සිව්පසයෙන් සංග්‍රහ කිරීමෙනි

07. පංච මහා විලෝකනය විමසා බැලීම තුළින් බෝසතාන් වහන්සේ තුළ පැවතියේ කුමන ගුණයක් ද

(I) සිතමතා විමසා බලා කටයුතු කිරීම (II) මහා කරුණාව

(III) පුරිස දම්මසාරථී ගුණය (IV) තාදි ගුණය

08. සංඝරත්නයේ ගුණයක් වන්නේ.

(I) අකාලිකෝ (II) ආහුනෙයියෝ (III) ලෝකවිදූ (IV) එහිපස්සිකෝ

09. සමථ භාවනාව හඳුන්වන වෙනත් නමක් වන්නේ

(I) ත්‍රිලක්ෂණ භාවනාව (II) ප්‍රඥා භාවනාව (III) සමාධි භාවනාව (IV) විපස්සනා භාවනාව

10. සමථ භාවනාවෙහි සඳහන් කමටහන් ගණන වන්නේ

(I) 65 කි (II) 40කි (III) 14 කි (IV) 55කි

11.භාවනාව යනුවෙන් අදහස් වන්නේ.

(I) සිල් රැකීමයි (II) කුසල්සිත් වැඩීමයි (III) නිවන් අවබෝධයයි (IV) ආර්ය අෂ්ඨාංගික මඟ වැඩීමයි

12. සිතෙහි තරහව ඇතිවන විට යමක් මතකයට නඟා ගත නොහැකිය පංචනිවාරණ ධර්මයට අනුව එය හඳුන්වන්නේ

(I) උද්දච්චකුක්කුච්ච (II) කාමඡන්ද (III) ව්‍යාපදය (IV)විචිකිච්චාව

13 බුදු දහමට අනුව සිත දියුණුකර ගැනීම සඳහා කළ යුත්තේ

(I) භාවනාව වැඩීමයි (II) ක්‍රිඩා කිරීමයි (III) විනෝදයෙන් කල්ගත කිරීමයි (IV) ධනය ඉපයීමයි.

14. සිත කිලටි කරන කුසල් සිත්වලට බාධාකරනු ලබන ධර්ම හඳුන්වනු ලබන්නේ

(I) ආපද්ධර්මය යනුවෙනි (II) පංචනිවරණ ධර්ම යනුවෙනි

(III) වරණ ධර්මය යනුවෙනි (IV) ත්‍රිලක්ෂණය යනුවෙනි

15. පාඩම්කරන සිසුන්ට වැදගත් වන භාවනාව වන්නේ.

(I) ආනාපනසති භාවනාව (II) පිළිකුල් භාවනාව

(III) සමථ භාවනාව (IV) විදර්ශන භාවනාව

16. ශිලයෙන් යුතුව සමථ භාවනාවේ යෙදෙන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ.

(I) ලද දෙයින් සතුටුවීම (II) අන්මතවලට ගරු කිරීම

(III) ශිලයෙන් යුක්ත බව (IV) සමාජශිලි බව

17.සිදුහත් කුමරා ගිහි ගෙය පිළිබඳ කළකිරී අභිනිෂ්ක්‍රමණය කළේ වයස අවුරුදු

(I) 16 දීය (II).29 දීය. (III) 35 දීය (IV) 45 දීය.



papers.lk

18. ශිලයෙන් යුක්තව සමථ භාවනාවට යොමුවීමේදී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග ගණන වන්නේ.

(I) තුනකි (II) දෙකකි (III) හතරකි (IV) පහකි

19. විපස්සනා භාවනාව මඟින් මෙනෙහි කරනු ලබන්නේ

(I) පංචනිවරණ ධර්මයන්ය (II) හේතුඵල ධර්මයන් (III) ත්‍රික්ෂාවන්ය (IV) තිලක්ෂණ ධර්මයන්ය

20.අනිත්‍ය , දුක්ඛ, අනාත්ම යනුවෙන් හඳුන්වන්නේ

(I) ත්‍රි විද්‍යාවයි (II) ත්‍රික්ෂාවයි (III) ත්‍රිලක්ෂණයයි (IV) තෙරුවනයි

21. අටලෝ දහමට අයත්වන කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

(I) අනිත්‍ය - දුක්ඛ (II) ලාභ -අලාභ (III) උඩ -යට (IV) පින් - පව

22. ශිල සංවරයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වවන බුද්ධිමත් වි දක්ෂ කෙලෙස් නසන වීර්ය ඇති විදර්ශනා ප්‍රඥාවෙන් යුක්ත වු තැනැත්තා

(I) ජීවිතයේ සියළු ගැටළු අවුල්කරගනි. .

(II) ජීවිතයේ සියළු අවුල් නිරවුල් කර නිවන පසක්කර ගනි

(III)අඹුදරුවන් සමඟ ඉතා සැපවත් ජීවිතයක් ගත කරයි.

(IV) ඉතා ධනවත් වේ

23. “උඩඟු නොව මහණ” යන පාඨය තම පිවිසිම් දොරටුවෙහි ලියා තබන ලද්දේ.

(I) වාරියපොළ සුමංගල හිමි (II) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(III) වැලිවිට අසරණ සරණ සිරි සරණකර හිමි (IV) මිගෙට්ටුවත්තේ ශ්‍රී සුමංගල හිමි

24. වැලිවිට අසරණ සරණසිරි සරණංකර හිමියන්ට සංඝරාජ පදවියට පිරිනමන ලද්දේ

(I) දුටුගැමුණු රජතුමා (II) ශ්‍රී විජය රාජසිංහ රජතුමා

(III) VI පරාක්‍රමබාහු රජතුමා (IV) කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

25.සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත ග්‍රන්ථයක් වන්නේ.

(I) මුණිගුණාංලංකාරය (II) පොහෙය දිනය

(III) ශාසනාවතරණය (IV) පාරමිතා ප්‍රකරණය

26. සිල්වත් සමාගම නමින් සංවිධානයක් පිහිටුවා බුදුදහමේ උන්තිය වෙනුවෙන් කටයුතු කරන ලද්දේ.

(I) අනගාරික ධර්මපාලතුමා (II) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා

(III) රේරුකානේ චන්දවිමල හිමි (IV) වැලිවිට අසරණ සරණ සරණකර හිමි

27. වැලිවිට අසරණ සරණ සිරි සරණකර හිමියන් උපත ලැබුවේ.

(I) 1695 ජුනි 20 (II) 1698 ජුනි 18

(III) 1679 ජුනි 18 (IV) 1978 ජුනි 18

28. තමා විසින් සිදුකළ යහපත් ක්‍රියා පින්පොතක සටහන් කරන ලද රජතුමා වන්නේ.

(I) දෙවනපෑතිස් රජතුමා (II) දුටුගැමුණු රජතුමා

(III) ධාතුසේන රජතුමා (IV) මහා පරාක්‍රමබාහු රජතුමා



papers.lk

29.දුටුගැමුණු රජතුමා විසින් සිදුකළ වෙසක් උත්සව ගණන වන්නේ

(1) 24 (11) 19 (111) 35 (1V) 12

30. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිනිය පිණිස මිස කිසි කලෙකත් රජසැප පිණිස නොවන්නේය මෙසේ ප්‍රකාශ කරන ලද්දේ.

(I) දුටුගැමුණු රජතුමා (II) දෙවනපැතිස් රජතුමා

(III) වලගම්බා රජතුමා (IV) මහා පරික්‍රමබාහු රජතුමා

31.බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගයේ ගමන් කළ හෙයින්

(I) සුගත නම් වන සේක (II) පුරිස දම්ම සාරිථී නම් වන සේක

(III) අරහං නම් වන සේක (IV) විජ්ජාචරණ සම්පන්න නම් වන සේක

32.අනිමිස ලෝචන පූජාව තුළින් බුදුරජාණන් වහන්සේ ලොවට දුන් ආදර්ශය වන්නේ.

(I) ගස්වැල් සුරකීම (II) සමාධිය වැඩීම

(III) කළගුණ සැලකිම (IV) පරිසරයට ආදරය කිරීම

33. බුදුරාජාණන් වහන්සේගේ අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය හඳුන්වන්නේ.

(I) අසරණ සරණ ගුණය ලෙසයි (II) තාදි ගුණය ලෙසයි

(III) ඉවසීම ලෙසයි (IV) මහා කරුණාව ලෙසයි

34. පංචස්කන්ධය ලෙස හඳුන්වන්නේ.

(I) රූප , ශබ්ද, ගන්ධ,රස, ස්පර්ශ (II) රූප , වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ

(III) ඇස, කන, නාසය, දිව, ශරිරය (IV) කාලය, දීපය, දේශය, කුලය,මව්

35.බුදුරාජාණන් වහන්සේගෙ අවසාන ශ්‍රාවකයා වූයේ.

(I) අනඳ තෙරුවන් (II) සුභද්‍ර තෙරුවන්

(III) මලියදේව තෙරුවන් (IV) සැරියුත් තෙරුවන්

36. ශිල, සමාධි,ප්‍රඥා යනුවෙන් අදහස් වන්නේ

(I) ත්‍රිවිධ ශික්ෂාවයි (II) ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා

(III) ත්‍රිවිධ අකුසල මූල (IV) ත්‍රිවිද්‍යාව

37. මෙත්තා , කරුණා , මුදිතා , උපේක්ඛා යනු .

(I) සතර සංග්‍රහ වස්තු (II) සතර පෙරනිමිති

(III) සතර බ්‍රහ්මවිහරණ (IV) සතර සංවර ශිලං

38. දේව ධර්මය හෙවත් ලෝක පාලක ධර්ම අඩංගු පිළිතුරු තෝරන්න.

(I) දාන -ශිල (II) හිරි - ඔතප් (III) විරති- සමාදාන (IV) ශ්‍රද්ධ - ප්‍රඥා

39. මහින්දගමනයෙන් පසුව මෙරට ඉදිවූ ප්‍රථම ස්ථූපය වන්නේ.

(I) ථූපාරාමය (II) රුවන්වැලිසෑය (III) මිරිස්වැටිය (IV) මහියංගන දාගැබ ය

40. සිතෙහි ඇතිවන උදාසිනකම පංචනීවර්ණ ධර්ම වලට අනුව හඳුන්වන්නේ .

(I) ව්‍යාපදය නමිනි (II) ථිනමිද්ධ නමිනි (III) කාමච්ඡන්ද නමිනි (IV) විචිකිච්ඡා නමිනි

papers.lk